**ශීර්ෂය 409- රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 16 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව.2022 ජූලි 12 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මුල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිළධාරීගේ වගකීම වගකීම

-----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ාරක්ෂක අංශයට අයත් රු.423,867ක වියදමක් ස්වදේශ කටයුතු අංශයේ වැය විෂයන්ගෙන් දරා තිබුණි. | කැබිනට් ලේකම්ගේ උපදෙස් පරිදි සිදු කරන ලදී. | නිවැරදි වැය විෂයයන් සඳහා ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) | අභ්‍යන්තර කටයුතු අංශයේ යන්ත්‍ර හා උපකරණ වටිනාකම අමාත්‍යාංශ පොත් අනුව රු.54,416,774ක් වුවද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 82) අනුව එම වටිනාකම රු.51,093,634ක් වූයෙන් වෙනස රු.3,323,140 ක් විය. | රාජ්‍ය ආරක්ෂක අංශයේ වත්කම් හා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ වත්කම් නිසි පරිදි මාරු පත්‍ර මඟින් ගිණුම්ගත නොකිරීමකි. | නිවැරදි කිරීම් සිදු කර ගිණුම් යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. |
| (ඇ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2021 පෙබරවාරි 24 දිනැති | නිල මැදුර පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල සඳහා රු.419,000,000ක මුදලක් | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවල |

| | | |
|---|---|---|
| SA/GFS/01/01/09-volume [illegible] දරන ලිපියට අනුව ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම හා සංවර්ධන වියදම් ගිණුම්ගත කළ යුතු වුවත් 2015 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරු වටිනාකම රු.419,000,000 පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි . | තක්සේරුකර ඇති අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. | ගොඩනැගිල්ල, ඉදි කිරීමේ වියදම් නොනිම් වැඩ ලෙස ගිණුම් ගත වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් විමසා සංවර්ධන වියදම්ද ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2.** මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 වියදම් කළමනාකරණය
----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50([illegible]) ප්‍රකාර ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කල යුතු වුවද ප්‍රාග්ධන වැය විෂයයන් 16 ක හා පුනරාවර්තන වැය විෂයයන් 16 ක මුළු ප්‍රතිපාදනයම පිළිවෙලින් රු.341,400,000ක් හා රු.14,745,000 ක් වශයෙන් එකතුව රු.356,145,000ක් ඉතිරි කර තිබුණි. | Covid-19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත පරිදි වියදම් සිදු නොකිරීම, 21/1596/304/134 අංක දරණ 2021.08.31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වියදම් සීමාකර ගැනීමට ලබාදුන් යෝජනා ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වැය විෂයන්වලට අදාල කටයුතු ඉටු නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව. | මු.රෙ.50(ii) ප්‍රකාර ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. |
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයන් 38 කට හා පුනරාවර්තන වැය විෂයයන් 48 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.6,569,467,625ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයන්ට අදාළ මුළු වියදම රු.3,579,472,619 ක් වූයෙන් ඉතිරිය රු.2,989,995,006 ක් විය. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 16ක සිට සියයට 99ක් අතර පරාසයක් ගෙන තිබුණි. | -එම- | -එම- |

2.2 සීමා ඉක්මවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත අවම ලැබීම් සීමාව වූ රු.මිලියන 600 ට වඩා තත්‍ය අවම ලැබීම් ශේෂය රු.142,047,589 කින් පහත වැටී තිබියදී අනුමත අවම ලැබීම් සීමාව රු.මිලියන 525 දක්වා රු.මිලියන 75 කින් පමණක් අඩුකර ගැනීමට 2021 දෙසැම්බර් 14 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් නිර්දේශය ලැබී තිබුණි. ඒ අනුව ඉතිරි රු.67,047,589 ක ප්‍රමාණයෙන් සීමා ඉක්මවීමක් නිරීක්ෂණය විය. | 2021.12.31 දිනට අත්තිකාරම් බී ගිණුම යටතේ ලැබීම් 409011 සඳහා රු.457,952,411.16 ක් ද 409012 සඳහා රු.114,901,392.09 ක් ලැබී ඇති අතර ඒ අනුව මුළු ලැබීම් වල එකතුව රු. 572,853,803.25 ක් වන බැවින් සීමා ඉක්මවීමක් සිදු වී නොමැති බව. | අනුමත සීමා පිළිපැදිය යුතු වීම. |

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) බැරකම් ලෙස සිගාස් වැඩසටහනේ දක්වා තිබූ රු.512,354,690 ක් මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා තිබුණු රු.11,378,934.00 ක බැරකම්, සිගාස් වැඩසටහනේ බැරකම්වල දක්වා නොතිබුණි. | සිගාස් පද්ධතියට දත්ත ඇතුළත් කළ නමුත් පද්ධතියේ ඇති වූ දෝෂයක් නිසා බැරකම් upload කළ නොහැකි වූ බව. | බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ රු.242,662,629 ක් මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු බැරකම් ලෙස 2019 දෙසැම්බර් 31 වන විට ස්වදේශ කටයුතු අංශය විසින් හඳුනාගෙන තිබුණද 2021 දෙසැම්බර් 31 වන විටත් එම බැරකම් නිරවුල් කර නොතිබුණි. | භාණ්ඩාගාරය වෙතින් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන හා අක්මුදල් ලබාදෙන ලෙස ඉල්ලීම් කළද තවමත් අවශ්‍ය ප්‍රතිපාදන හා අක්මුදල් නොලැබීම මත මෙම බැරකම් නිරවුල් කිරීමට නොහැකි වී ඇත. | බැරකම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 1.2 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ නිදහස් උත්සවයේ සංවිධාන කටයුතුවල නිරත නිලධාරීන්ට දිරි දීමනා ලෙස රු.827,530 ක් ලබා දී තිබුණද, ඒ සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2022 නිදහස් උත්සවයේ සංවිධාන කටයුතුවල නිරත නිලධාරීන්ට දිරි දීමනා ගෙවීමේදී ආයතන අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ලබාගෙන කටයුතු කල බව. | පූර්ව අනුමැතිය ලබා නොගෙන ගෙවීම් නොකළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 427 | දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර පොත් සමඟ සැසඳිය යුතු වුවත් දිස්ත්‍රික්ක 04ක රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ශේෂයන් අතර රු.2,175,542 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශේෂ අතර ඇති වෙනස හදුනා ගෙන නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතින බව . | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතු වීම. |

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 විදේශ ආධාර ව්‍යාපෘති
--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාය යෑම් අවම කිරීම සඳහා වූ වැඩසටහන සඳහා ආපදා අංශයේ වාර්ෂික ඇස්තමේන්තුව මගින් 409-2-11-13-2509(13) හා 409-2-11-9-2509(13) වැය විෂයයන් යටතේ විදේශ ප්‍රදාන පිළිවෙලින් රු.150,000,000 ක් හා රු.130,000,000 ක් වෙන්කර තිබුණි. මෙම ප්‍රතිපාදනයන් සම්පූර්ණයෙන් ඉතිරිවීම් ලෙස දක්වා එම ඉතිරිවීම්වලට හේතු දැක්වීමේ දී මෙම වැඩසටහන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කරන බැවින් වියදම් වාර්තා ඉදිරිපත් නොවීම ලෙස දක්වා තිබුණි. එසේ වුවද වර්ෂය තුළ දී මෙම වැඩසටහන යටතේ දැරූ වියදම කොපමණද යන්න හෝ වියදම් දරා නොමැති බව සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමට කටයුතු නොකර මුළු මුදලම ඉතිරිවීම් ලෙස දැක්වීම පිළිගත නොහැකි විය. | ජපාන ජත්‍යන්තර සංස්කෘතික ඒජන්සියේ තාක්‍ෂණික සහයෝගිතාව යටතේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීම සඳහා මෙම ප්‍රතිපාදන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා වෙන් කරනු ලබන බවත් එසේ දායක ආයතනය විසින් වෙන්කරන අරමුදල් ඍජුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත නොලැබෙන අතර ව්‍යාපෘතියේ තාක්‍ෂණික උපකරණ ප්‍රදානය ඇතුලු සියලු ව්‍යාපෘති පිරිවැය එමඟින් දරනු ලබයි. එම වියදම් වාර්තා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත ඉදිරිපත් නොකරන බව ආපදා කළමනාකරණ අංශය වෙතින් දන්වා ඇති බව. | ප්‍රදාන වශයෙන් ලද මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර ලබාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වීම. |

3.2 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නිල මැඳුර ගොඩනැගිල්ල III අදියරය නිම කිරීම හා එහි නඩත්තු සේවා සැපයීම : | | |
| (i) "නිල මැඳුර " ගොඩනැගිල්ලේ අදියර □□□ ඉදිකිරීම 2019 දෙසැම්බර් 26 දින දක්වා දින දීර්ඝ කිරීමට 2021 සැප්තැම්බර් 27 දිනැති අංක අමප/21/1689/303/063-1 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණ ද, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය **(CECB)** මඟින් ඉදිරිපත් කරන ලද කාර්ය සාධන සහතිකය අනුව වැඩ නිම කර තිබුණේ 2020 දෙසැම්බර් 26 දින දීය. එබැවින් ගිවිසුම් ප්‍රකාරව වසරක කාලයක් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 174.35 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කරුට ප්‍රමාද වී මුදල් ගෙවීම හේතුවෙන් කොළඹ දිස්ත්‍රික් ලේකම් විසින් රු.17,112,625 ක පොළියක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | Date of Completion of Contract තුළ ඉදිකිරීම් දෝෂ නිවැරැදි කිරීමේ කාලය (Defect Notification Period) ලෙස වසරක කාලයක් (දින 365) කොන්ත්‍රාත් ගිවිසුමේ Contract Data හි 11.3.7. අනුව ඇතුළත් වේ. ඒ අනුව, වසරක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට අවශ්‍ය නොවන බව හා අක්මුදල් ලබාගැනීමේ ප්‍රමාදය නිසා ගෙවීම් ප්‍රමාද වී ඇති බව . | ප්‍රමාද ගාස්තු අයකර ගත යුතු වීම හා මුදල් ගෙවීමට ප්‍රමාද වළක්වාගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර ක්‍රියාමාර්ග ගත යුතු වීම |
| (ii) අධීක්ෂණ හා නඩත්තු කටයුතු කිරීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් ගොඩනැගිල්ලේ නඩත්තු සේවා සැපයීමේ කාර්යභාරය □□□□ ආයතනයට පැවරීම සඳහා 2020 | සේවයේ නිරතව සිටි ඉංජිනේරු අංශයේ කාර්යය මණ්ඩලය වෙතින් අදාළ සේවා අවශ්‍යතාවය සම්පූර්ණ කර ගත නොහැකි බව අතිරේක ලේකම් (තාක්ෂණ) විසින් පෙන්වා දී ඇත. එම නිසා නිල මැඳුර | නඩත්තු පිරිවැය අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සැප්තැම්බර් 22 දිනැති අංක □□/07/2020 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි. එම සංදේශයේ ඡේද අංක 1.5 මඟින් නඩත්තු සේවා කාර්ය මණ්ඩලය 04 ලෙස දක්වා තිබුණද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දැනුම් දීම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නඩත්තු අංශයේ කාර්ය මණ්ඩල 03 දෙනෙකුගේ සහාය ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳව සඳහනක් කර නොතිබුණි. එබැවින් නඩත්තු කිරීමට ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති බවට අදහස් දැක්වීම විගණනයේදී පිළිගත නොහැකි විය. තවද විගණිත දිනය වූ 2022 අප්‍රේල් 18 වන විටත් නඩත්තු ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි පරිශ්‍රයේ නඩත්තු ඒකකයේ පවතින කඩිනම් සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අමාත්‍යාංශයේ ඉහළ කළමනාකාරීත්වය තීරණය කරනු ලැබ ඇත්තේ නිල මැදුර ගොඩනැගිල්ලේ ඉදි කිරීමේ කාර්යයේ උපදේශක ආයතනය ලෙස කටයුතු කළ, එමෙන්ම දීර්ඝකාලින අත්දැකීම් සහිත CECB ආයතනය වෙත නඩත්තු කටයුතු ගිවිසුම්ගතව භාරදීමටයි. ඒ අනුව, අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ඉදිරි පියවර ගෙන ඇත. | |
| (iii) | නඩත්තු හා සේවා සැපයීමේ කාර්යය CECB ආයතනයට පැවරීමට උක්ත සංදේශය ඉදිරිපත් කළද 2020 ඔක්තෝබර් 13 දිනැති අංක අමප/20/1432/303/016 දරන අමාත්‍ය මණ්ඩලය මගින් එම කාර්යය සඳහා රාජ්‍ය ආයතනවලින් මිල ගණන් කැඳවීමට තීරණයක් ලබා දී තිබුණි. ඒ අනුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය රු.25,500,000 ක් හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව රු.35,068,272 ක් ලෙස ලංසු ඉදිරිපත් කර තිබුණු අතර මෙම කාර්යය සඳහා යෙදවීමට අපේක්ෂිත සේවක සංඛ්‍යාව 9 ක සිට 11 ක් දක්වා සහ වටිනාකම රු.28,689,501 ක් දක්වා ඉහළ දමා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විනිවිදභාවයෙන් හා ප්‍රසම්පාදනයේ | ඉංජිනේරු අංශය විසින් මූලික යෝජනාවක් පමණක් ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කර තිබුණද ඉන් අනතුරුව අමාත්‍යාංශය, කොළඹ දි.ලේ කාර්යාලය ඇතුළු මේ සම්බන්ධ අනෙකුත් අංශ සමඟ සාකච්ඡා පවත්වා විධිමත් පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. | රජයට උපරිම වාසි ලැබෙන පරිදි ප්‍රසම්පාදනයන් සිදු කිරීම ප්‍රසම්පාදන කමිටුවල වගකීම විය යුතු වීම හා ප්‍රසම්පාදනය විනිවිදභාවයෙන් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | උපරිම වාසි ලබාගැනීමට ස්වාධීන ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් කිරීමට කටයුතු නොකර CECB ආයතනය වෙතින් ලබාගත් යෝජිත ඇස්තමේන්තු මිල ගණන් උපයෝගී කරගෙන ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. එසේ තිබියදී එම ආයතනයෙන්ද මිල ගණන් කැඳවා කොන්ත්‍රාත්තුව එම ආයතනයටම පිරිනැමීම මතභේදයට තුඩු දෙන කරුණක් විය. | | |
| (ආ) | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම : | | |
| (i) | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම කඩිනම් කිරීමට, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුව සිදුකිරීමට පවතින කාල සීමාව ප්‍රමාණවත් නොවීම හා සමහර ගෘහභාණ්ඩ ඉදිකිරීමට ඇතුලත් කර (Built in) නිම කිරීමේ අවශ්‍යතාවය පැවතීම ලෙස විවිධ හේතු ඉදිරිපත්කර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු වෙතම මෙම ප්‍රසම්පාදනය පිරිනැමීමට 2018 ජනවාරි 10 දිනැති අංක අමප/17/2912/721/003-1 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. එසේ වුවද මිලදී ගැනීමේ ලංසු ලියවිලි අනුමත කිරීම වසරක් ප්‍රමාද කර 2019 ජනවාරි 14 දින සිදුකර තිබුණි. | අමාත්‍යාංශය මෙම ගොඩනැඟිල්ලේ ස්ථාපිත කිරීම විවිධ හේතුන් මත වසර 1 ½ ක් ප්‍රමාද වී 2019.07.25 දින සිදු වී ඇත. මෙම ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් වන කොන්ත්‍රාත්තුව 2019.04.30 වන දින ප්‍රදානය කිරීමෙන් අමාත්‍යාංශය ස්ථාපිත කිරීමට සමගාමීව සිදු වීමෙන් අපේක්ෂිත අවශ්‍යතාවය නිසි පරිදි ඉටු කරගැනීමට බාධාවක් සිදු නොවූ බව. | කාලරාමු නිශ්චය කර සැලසුම් සහගත ලෙස ක්‍රියා කළ යුතු වීම. |
| (ii) | මිලදී ගැනීමේ කාර්යය සඳහා අනුමත ප්‍රතිපාදනය රු.මිලියන 200 වුවද, එම මිලදී ගැනීම සඳහා ගොඩනැගිල්ල ඉදිකරනු ලබන කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ලංසු වටිනාකම රු.229,000,000 ක් විය. එබැවින් මොබයිල් රැක්ස් ප්‍රමාණය | ප්‍රසම්පාදන තීරණ ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රතිග්‍රහණ ලිපිය කොන්ත්‍රාත්කරුට පිරිනමා ඇති අතර ඒ අනුව නිත්‍යානුකූලව කොන්ත්‍රාත්තුව ස්ථාපිත වී ඇති බව. | මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | 448 සිට 150 දක්වා අඩුකොට රු.199,068,993 කට ප්‍රසම්පාදනය පිරිනැමීමට 2019 අප්‍රේල් 25 දින අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. එසේ වුවද අවශ්‍ය ප්‍රතිපාදන නොතිබිය දී උක්ත මිල ගණන් යටතේම ඉතිරි රාක්ක 298ක් රු.29,902,424 කට මිලදී ගැනීමට 2019 ජූලි 03 දින එම කමිටුව විසින් තීරණය කර මිලදී ගෙන තිබුණි. එසේ වුවද මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබාගෙන තිබුණේ 2021 නොවැම්බර් 15 දිනැති අමප/21/1921/303/152 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මගිනි. | | |
| (iii) | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු වෙතම මෙම ප්‍රසම්පාදනය පිරිනැමීමට කටයුතු කර තිබුණ ද, සමහර ගෘහභාණ්ඩ හා උපකරණ වෙනත් ආයතන වෙතින් මිලදීගෙන සියයට 10 ක ලාභාන්තිකයක් සහිතව සපයා තිබූ බැවින් රු.17,484,813 ක අලාභයක් රජයට සිදුවී තිබුණි | මෙලෙස ප්‍රධාන කොන්ත්‍රාත්තුකරු විසින් උපකොන්ත්‍රාත්තු දීම රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සාමාන්‍ය ක්‍රියාවක් වන අතර එසේ කිරීම වැළැක්විමට අවශ්‍ය නම් ඒ සම්බන්ධයෙන් වගන්තියක් ලංසු ලියවිල්ලේ ඇතුළත් කළ යුතු වේ. මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් එවැනි වගන්තියක් ලංසු ලියවිල්ලේ ඇතුළත් කර නොමැති බැවින් සාමාන්‍ය ක්‍රියාපටිපාටිය අනුගමනය කර ඇත. | රජයට උපරිම වාසි ලැබෙන අයුරින් කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ගාල්ල ශ්‍රවණාගාරය ඉදිකිරීම : | | |
| (i) | විධිමත් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව රු.මිලියන 1700 ක් වූ මුල් පිරිවැය ඇස්තමේන්තුව සකස් කර රු.මිලියන 2,656.88 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද, විගණිත දිනය වන විට ඇස්තමේන්තු අගය රු.මිලියන 3,154.88 ක් වී තිබුණි. | ලංසු තැබීමේ ක්‍රියාවලිය ආරම්භයේ දී ලංසුකරුවන් කිහිප දෙනෙක් සිටියද පිරිවැය යෝජනා සඳහා සුදුසුකම් ලැබුවේ ලංසු 2ක් පමණි. තේරිපත් වූ ලංසු මිලෙහි වටිනාකම රු.මිලියන 2,656.88කි. නමුත් අපේක්ෂා නොකල පරිදි භූමියේ ඇති වූ තත්ත්වය මත වෙන්කිරීම් | විධිමත් ශක්‍යතා අධ්‍යයනයකින් හා සැලසුම් සහගත ලෙස ක්‍රියා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රමාණවත් නොවූ බැවින් අමතර රු.මිලියන 498ක් වෙන්කර ගැනීමට කටයුතු කරන ලදී. | |
| (ii) | විගණන දින වන විට අත්තිකාරම් ඇතුළුව රු.මිලියන 717 ක් (බදු සහිත) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණ අතර උපදේශක විසින් නිර්දේශ කරන ලද අතැති බිල්පත් රු.මිලියන 238.95 ක් (බදු සහිත) විය. එසේ වුවද ශ්‍රවණාගාරයේ මූලික අදියරේ ඉදිකිරීම් පමණක් ඉටුකර ඇති බැවින් වැය කර තිබූ මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | ප්‍රතිපාදන ලබා දී තිබුණ ද අක් මුදල් නොමැති වීමෙන් හා කොන්ත්‍රාත් ගිවිසුමේ කාල සීමාව 2021.01.29 දිනෙන් අවසන් බැවින් බිල්පත් ගෙවීම ප්‍රමාද වී ඇති බවට දන්වා ඇත. අත්තිකාරම් වශයෙන් රු.475,958,822.38ක මුදලක් කොන්ත්‍රාත් සමාගමට ගෙවා ඇත. කොන්ත්‍රාත්කරු වෙත සම්පූර්ණ අත්තිකාරම් මුදල ගෙවා ඇති බැවින්, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද අතැති බිල්පත් වටිනාකම අඩු කිරීමෙන් පසුව කොන්ත්‍රාත්කරුට ගෙවීමට සුළු මුදලක් පමණක් ඉතිරිවේ යැයි උපකල්පනය කර ඇත. | රජයට සිදුකර ඇති පාඩුව සම්බන්ධයෙන් අදාළ නිළධාරීන් වගකිව යුතු වීම. |
| (ඇ) | පොලිසැක් බැග් 50,000 ක් මිලදී ගැනීම - ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය : | | |
| | ඉදිරියේදී ඊසාන දිග මෝසම් වර්ෂාව සක්‍රීය වීමෙන් දිවයිනේ උතුරු නැගෙනහිර පළාත්වලට හා අනෙකුත් ප්‍රදේශවලට ඇතිවිය හැකි හදිසි අවශ්‍යතාවයන්ට ප්‍රයෝජනයට ගැනීමට පොලිසැක් බැග් 15,000 ක් මිලදී ගැනීමට ආයතන 35 කින් මිල ගණන් කැඳවා තිබුණද ආයතන 03කින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. නැවත 2021 නොවැම්බර් 08 දින හදිසි අවශ්‍යතාවයක් බව දක්වමින් පොලිසැක් බැග් අවශ්‍යතාව 50,000 දක්වා වැඩිකර ෆැක්ස්/ඊමේල් මඟින් එදිනම මිල ගණන් | අපේක්ෂා කල පරිදි 2021 වර්ෂයේ ඊසාන දිග මෝසම බලවත් ලෙස සක්‍රිය නොවූ බැවින් මෙම පොලිසැක් බැග් භාවිතයට ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනැගිණ.කෙසේ වුවද ඉදිරි ඕනෑම ආපදා තත්වයකදී භාවිතයට ගත හැකි ආරක්ෂිත තොගයක් ලෙස මෙම පොලිසැක් බැග් තබා ගන්නා බව. | අත්‍යවශ්‍ය මිලදී ගැනීම් පමණක් සිදු කිරීම නිලධාරීන්ගේ වගකීම විය යුතු වීම. |

ඉදිරිපත් කරන ලෙස උක්ත ආයතන 03 වෙත දන්වා තිබුණ අතර ඒ අනුව 2021 දෙසැම්බර් 24 දින රු.3,024,000 කට මිලදී ගැනීම සිදුකර තිබුණි. ඊසාන දිග මෝසම බලවත් ලෙස සක්‍රීය වීමට පෙර හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා මිලදී ගැනීම සිදුකර තිබුණද පොලිසැක් බෑග් භාවිතයට ගෙන නොතිබීම හේතුවෙන් මෙම මිලදී ගැනීම හදිසි තත්ත්වයක් නොවුණි.

3.3 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිලමැදුර ගොඩනැගිල්ල ඉදි කර ඇති ඉඩමේ තක්සේරු වටිනාකම රු.458,900,000 ක් වශයෙන් ගිණුම්ගත කර තිබුණ නමුත්, ඉඩම අමාත්‍යාංශය වෙත මෙතෙක් පවරා ගෙන නොතිබුණි. | මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩම විධිමත්ව පවරා දෙන ලෙසට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත මේ වන විටත්, විධිමත් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. | ඉඩම පවරා ගැනීම කළ යුතු වීම. |
| (ආ) | 2020 වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් වෙනත් අමාත්‍යාංශ දෙකක් වෙත භාරදී ඇති රු.1,258,061 ක ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සංඛ්‍යාව 71 ක් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කලමනාකරණ අංශ වෙත ලබා දී ඇති භාණ්ඩ අයිතමයන්ට අදාල ලැබීම් නියෝග පමණක් මෙතෙක් ලැබී නොමැත. | ලැබීම් නියෝග ලබාගෙන වත්කම් පොත්වලින් ඉවත් කිරීම කළ යුතු වීම. |
| (ඇ) | මේස මිලදී ගැනීමේ දී එහි උපාංගයක් ලෙස ලැබී තිබූ පෙඩෙස්ටල් 18ක් රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයට 2021 වර්ෂයේදී ලබා දී තිබුණි. මෙම පෙඩෙස්ටල් | එවකට පැවති රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය මගින් මේස මිලදී ගැනීමේදී එහි උපාංගයක් ලෙස ලැබී තිබූ Pedestel 18 ක් තවදුරටත් එම ස්ථානයෙහි රඳවා තබා ගන්නා බව | පෙඩෙස්ටල් 18 ලබාගෙන මේස සඳහා භාවිතා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලබාගෙන මේස සඳහා භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021.03.03 දිනැතිව යොමු කරන ලද ලිපිය මඟින් දන්වා ඇත. ඒ සඳහා අමාත්‍යාංශය 2021.03.05 අනුමැතිය ලබාදී ඇත. | |
| (ඇ) | අමාත්‍යාංශය යටතේ පවතින සංචාරක බංගලා 35ක් හා ඊට අයත් ඉඩම් පවරා ගැනීම හා ඒවා තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම සිදුකර නොතිබුණි. | සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත සංචාරක බංගලාව පිහිටි ඉඩමේ හිමිකම(ඔප්පුව/පත්තිරු/පිඹුර) ගොඩනැගිලි සම්බන්ධ විස්තර හා ගොඩනැගිලි සඳහා තක්සේරු වාර්තා පිළිබඳව විමසමින් 2022.05.25 දිනැතිව ලිපියක් ඉදිරිපත් කර ඇති බව. | සංචාරක නිවාසවල අයිතිය නිරවුල් කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතු වීම. |
| (ඉ) | ස්වදේශ කටයුතු අංශය සතු වාහන 7ක් හා ආපදා කළමනාකරණ අංශය සතු වාහන 06ක් වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ලබාදී තිබුණද එකී වාහන අදාල ආයතන වෙත විධිමත් ලෙස පවරා දීමට හෝ නැවත ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | තාවකාලික පදනමින් ලබා දී ඇති රථවාහන නැවත මෙම අමාත්‍යාංශය වෙත පවරා දෙන ලෙස අවස්ථා ගණනාවකදී ඉල්ලීම් කර ඇතත් මෙතෙක් ආපසු භාර දී නොමැත. | විධිමත් ලෙස පවරාදීම හෝ ආපසු ලබාගැනීම සිදු කළ යුතු වීම. |
| (ඊ) | වර්ෂ 05කට වැඩි කාලයක සිට විදුලි ජනන යන්ත්‍ර 28ක් ගබඩාවේ තිබියදී පසුගිය වර්ෂයේදී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් විදුලි ජනන යන්ත්‍ර 14 **ක්** මිලදී ගෙන බෙදාහැරීමකින් තොරව ගබඩාවේ රඳවාගෙන තිබුණි. තවද 2019 වර්ෂයේදී මිලදී ගන්නා ලද ටාපොලින් සීට් 255ක් බෙදා හැර නොතිබුණි. | දිස්ත්‍රික්ක වෙත බෙදාදීමට කටයුතු කළ නමුත් විදුලිජනක යන්ත්‍ර ප්‍රවාහනය කිරීමේ ඇති අපහසුතාවය හේතුවෙන් සමහර දිස්ත්‍රික්කවලින් ඒවා රැගෙන යාමට කටයුතු කර නොමැත. එසේම, කි.වො. 03ක ධාරිතාවයෙන් යුතු විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීම සිදු කර ඇත්තේ ආපදා අවස්ථාවලදී ජනතාව රඳවා තබා ගැනීමට භාවිතා කරනු ලබන සුරක්ෂිත මධ්‍යස්ථාන සඳහා වන අතර පරිත්‍යාග වශයෙන් ලද ධාරිතාවයෙන් ඉතා විශාල විදුලිජනක යන්ත්‍ර ඒ සඳහා භාවිතා කළ නොහැකි වීම එයට හේතු වී ඇත. | අනවශ්‍ය මිලදී ගැනීම් සිදු නොකළ යුතු වීම හා විදුලිජනක යන්ත්‍ර බෙදාහැරීම හෝ ඵලදායී කාර්යයකට යොදාගැනීමට සිදු කළ යුතු වීම. |

3.4 කළමනාකරණ දූර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.22,671,704 ක් විය. එයින් මාස 03ට වැඩි ශේෂ අතර ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් රු.8,415,764ක් ද, විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් රු.1,225,452ක් ද, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් රු.1,316,782ක් ද, මියගිය නිලධාරීන්ගෙන් රු.1,186,395 ක් ද, වැඩ තහනම් කල නිලධාරීන්ගෙන් රු.332,753 ක් ද වශයෙන් එකතුව රු.12,477,146 ක් අයකර ගෙන කර නොතිබුණ අතර, මෙයින් වර්ෂ 05 ඉක්ම වූ ශේෂය රු.951,530 ක් විය. | මෙම හිඟ ණය ශේෂයන් අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විටත් අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ණය ශේෂ අයකල යුතු වීම. |
| (ආ) | ආපදා කළමනාකරණ අංශය : | | |
| | නායයෑම් තර්ජනය සහ නායයෑම් හේතුවෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ කර 2021 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 850 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද එයින් රු.මිලියන 651 ක් වැයකර තිබුණි. මෙහිදී නිවාස 250ක කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණද , නිවාස 36 ක කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. | නිවාස ඉදිකිරීමේ ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා තම ශ්‍රමය යොදාගනිමින් නිවාස ඉදිකර ගැනීමට ශක්‍යතාවක් නොමැති ප්‍රතිලාභීන් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවෙකු මඟින් නිවාස ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන විට ලබාගෙන ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලබයි. | ප්‍රමාදයන් අවම කරගැනීමට කටයුතු කර ව්‍යාපෘතියේ අරමුණ ළඟා කර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) කෑගල්ල ප්‍රදේශයේ හානියට පත් ඉඩම්වල නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ නිවාස 124 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 70 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 13.67 ක් පමණක් වැයකර නිවාස 34 ක පමණක් ඉදිකිරීම සම්පූර්ණ කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඈ) මහනුවර දිස්ත්‍රික්කයේ නායයාමේ අවදානමට ලක්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය : | | |
| (i). මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල **20**න් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක අධි අවදානම් කළාපවල ජීවත්වන පවුල් එම ස්ථානවලින් ඉවත් කොට නැවත පදිංචි කිරීමට අදාළ ප්‍රතිලාභ ලබාදීමේ භෞතික ප්‍රගතිය සියයට 0 ක සිට සියයට 19 ක් දක්වා අවම මට්ටමක පැවතුණි. | මෙතෙක් අදහස් දක්වා නැත | ප්‍රතිලාභ ලබාදීම කඩිනමින් නිම කළ යුතු වීම. |
| (ii). 2021 පෙබරවාරි 24 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා නිර්දේශ අංක 10 අනුව අවදානම් ස්ථානවල නැවත පදිංචි කිරීම වැළැක්වීම සඳහා ස්ථාවර නීතිමය පියවරක් ලබාදෙන තෙක් දිස්ත්‍රික්ක සියල්ලටම බලපාන අයුරින් චක්‍රලේඛයක් නිකුත් කිරීම සිදුවී නොමැති බවත්, 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරන පනතේ සංශෝධන සකස් කෙරෙමින් පවතින බවත් නිරීක්ෂණය විය . | මේ වන විට ආපදා කළමනාකරණ පනත සංශෝධන කටයුතු සිදුකරමින් පවතින බව**.** | පොදු ව්‍යාපාර කාරක සභා නිර්දේශ අනුගමනය කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (iii) නියැදි විගණන පරීක්ෂාවේදී මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක ආපදාවට ලක්වූ පවුල් 272 ක් නැවත පදිංචි කිරීමේ විකල්ප ක්‍රම ප්‍රතික්ෂේප කිරීම මත ඔවුන් අවදානම් ස්ථානයෙන් ඉවත් කිරීමට වෙනත් ක්‍රමයක් විගණිත දිනය වන විට ස්ථාපිත කර නොතිබුණි. | මෙතෙක් අදහස් දක්වා නැත | අවධානම් ස්ථානවලින් පවුල් ඉවත් කිරීමට කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු වීම. |
| (ඉ) මාතලේ දිස්ත්‍රික්කයේ නායයාමේ අවදානමට ලක්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය : | | |
| (i) මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක අධි අවදානම් කළාපවල ජීවත්වන පවුල් එම ස්ථානවලින් ඉවත් කොට නැවත පදිංචි කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 13 සිට සියයට 38 දක්වා අවම මට්ටමක පැවතුණි. | -එම- | අධි අවධානම් කලාපවල ජීවත් වන පවුල් කඩිනමින් ඉවත් කොට වෙනත් ස්ථානවල පදිංචි කරවීමට ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු වීම. |
| (ii) රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැවත පදිංචි කිරීමේ ප්‍රතිලාභීන් තිදෙනෙකු වෙත රු.400,000 බැගින් **3** වන වාරිකය 2020 මැයි 31 දිනැතිව නිදහස් කර වර්ෂ 01 කට වැඩි කාලයක් ගතව ඇති නමුත් විගණිත අවස්ථාව වන තෙක් ඉතිරි වාරික නිදහස් කිරීමට හා නැවත පදිංචි කරවීමට පියවර ගෙන නොතිබුණි. | -එම- | ඉතිරි වාරික නිදහස් කර නැවත පදිංචි කිරීම කඩිනමින් කල යුතු වීම. |
| (iii) උකුවෙල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ඉඩමක් මිලදීගෙන නිවාස ඉදිකිරීමේ විකල්ප අවස්ථාව යටතේ නැවත පදිංචි කිරීමේ ප්‍රතිලාභීන් තිදෙනෙකුට 2019 වර්ෂය වන විට එකතුව රු.1,800,000 ක ප්‍රතිලාභ ගෙවා තිබුණද අවදානම් ප්‍රදේශයේම ජීවත්වන බව නිරීක්ෂණය විය. | -එම- | නිසි අධීක්ෂණයක් යටතේ ප්‍රතිලාභීන්ට මුදල් නිදහස් කල යුතු වීම හා අවධානම් ප්‍රදේශවලින් ඉවත් වීමට දිරිගැන්විය යුතු වීම. |

| | | |
|---|---|---|
| (iv) උකුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ එනසල්මඩ රජයේ ඉඩම තුල නිවාස 25ක් ඉදිකිරීම සඳහා ප්‍රතිලාභීන් 25 ක් වෙත රු.6,400,000 ක් 2019 දෙසැම්බර් 13 වන විට ලබාදී තිබුණද එම නිවාසවල වැඩ නිමකර නොතිබීම හේතුවෙන් වල්බිහිවී දිරාපත්වෙමින් පැවති අතර විගණිත දිනය වන විටත් ප්‍රතිලාභීන් අවධානම් සහිත නිවාසවලම ජීවත් වේ. | -එම- | –එම- |
| (v) මාතලේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අධි අවදානම් කළාපවල ජීවත්වන බවට හඳුනාගත් පවුල් 152 ක් වෙත 2022 පෙබරවාරි 14 වන විටත් ප්‍රතිලාභ සලසා නොතිබුණි. 2018 වර්ෂයේදි ලියාපදිංචි කරගෙන තිබූ ප්‍රතිලාභීන් 09 දෙනෙකු සඳහාද විගණිත දිනය වන විට ප්‍රතිලාභ සලසා නොතිබුණි. | -එම- | හඳුනාගත් පවුල් වෙත නොපමාව ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළයුතු වීම. |
| (vi) යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැවත පදිංචි කළයුතු පවුල් 70 ක් අවදානම් ස්ථානවල පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. තවද නැවත පදිංචි කිරීමේ මාර්ගෝපදේශයේ 10.3 ප්‍රකාරව නිවාස ඉදිකිරීමට අදාළව සිව්වන වාරිකය වන රු.25,000 නිදහස් කිරීමට අනුකූලතා සහතිකය ලබාගත යුතු වුවත්, එය ලබා නොගෙන 2021 දෙසැම්බර් මාසයේ ප්‍රතිලාභියෙකු වෙත රු.300,000 ක සම්පූර්ණ මුදලම එකවර ගෙවා තිබුණි. | -එම- | පදිංචිය සඳහා වෙනත් ස්ථාන ලබා දී අවධානම් ප්‍රදේශවලින් පවුල් ඉවත් කිරීම සිදු කළ යුතු වීම. |